ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
உள்நாட்டு தொழிற்பாடுகள் திணைக்களம்
Domestic Operations Department

**චක්‍රලේඛ අංක. : 2023/03**

2023 දෙසැම්බර් 22

සියලුම බලයලත් මුදල් හුවමාරුකරුවන් වෙත,

**බලයලත් මුදල් හුවමාරුකරණ සමාගම්වල වාර්ෂික සහතික පත්‍ර ගාස්තු**

2018 අංක 01 දරන මුදල් හුවමාරුකරණ රෙගුලාසි 7(අ) සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ. ඒ අනුව, උක්ත විධිවිධානවලට අදාළ බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ තීරණ පහතින් දැක්වේ.

1) නැවත දැනුම් දෙන තුරු බලයලත් මුදල් හුවමාරුකරණ සමාගම් විසින් වාර්ෂික සහතික පත්‍ර ගාස්තු වශයෙන් රුපියල් තුන්ලක්ෂ පනස්දහසක (රු: 350,000.00) මුදලක්, අනෙකුත් රජයේ බදු අදාළ වේ නම් එකී බදු මුදල් ද සමග, ගෙවිය යුතුය.

2) ඉහත සඳහන් වාර්ෂික සහතික පත්‍ර ගාස්තුව සියලුම බලයලත් මුදල් හුවමාරුකරණ සමාගම් විසින් සෑම වසරකම ජනවාරි මස 31 දින හෝ ඊට පෙර ගෙවිය යුතුය.

3) ප්‍රථම වරට මුදල් හුවමාරුකරණ ව්‍යාපාරයෙහි නිතර වීම සඳහා අයදුම් කරනු ලබන සමාගමකට බලය පැවරීමේ සහතිකය නිකුත් කිරීමේදී, එකී සමාගම විසින් අයදුම්පත් සැකසීමේ ගාස්තුව වශයෙන් රුපියල් විසි දහසක (රු: 20,000.00) මුදලක්, වාර්ෂික සහතික පත්‍ර ගාස්තුව සහ අදාළ අනෙකුත් බදු මුදල් වේ නම් ඒවා ද සමග ගෙවිය යුතුය.

මෙම චක්‍රලේඛය නිකුත් කළ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත අවශ්‍යතාවලට අනුකූලව සියලුම බලයලත් මුදල් හුවමාරුකරුවන් විසින් කටයුතු කළ යුතුය.

**ආචාර්ය ආර්.ඒ. අනිල් පෙරේරා**
**අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු**